#mediaethicsSL #SinhalaPress #lka #Ada #Lakbima #Dinamina #Lankadeepa #Mawbima #sundayLankadeepa #SundayDivaina #Silumina #SundayMawbima #SathiAgaAruna

යම් පුද්ගලයෙකු විසින්ම තමන්ගේ ජීවිතය අහිමි කර ගැනීමේ සිදුවීමක් වාර්තා කිරීමේදී සැලකිලිමත් විය යුතු ජනමාධ්‍ය ආචාර ධර්මයන් ජාත්‍යන්තරවද හඳුන්වා දීම සඳහා වන හේතු අතර ප්‍රමුඛතම එක් හේතුවක් ඇත. එනම්, එම පුවත්පත් වාර්තාවන් හෝ ලිපි කියැවීම ඔස්සේ, තවත් පුද්ගලයෙකුට සිය ජීවිතය අහිමි කර ගැනීමට පෙළඹවීමක් ඇතිවීම වැළැක්වීමයි. එනිසා මෙවැනි ජීවිතය අහිමි කර ගැනීමේ පුවත් ආචාර ධර්මයන් පිළිබඳ සැලකිල්ලකින් යුතුව පළ කිරීම ඉතාමත් වැදගත් වන බව නැවත නැවතත් කිව යුතුවේ.

කෙසේ නමුත් මහජන ලැදියාවට විශේෂයෙන් අදාළ වන සිදුවීමකදී, මෙම ජීවිතය අහිමි වීම සම්බන්ධ පුවත් වලදී පිළිපැදිය යුතු ආචාර ධර්මයන් ඒ ආකාරයෙන්ම පිළිපැදීම උගහට විය හැක. එයට උදාහරණයක් ලෙසින් දැක්විය හැක්කේ මෑතකදී නවක වදය හේතුවෙන් ජීවිතයෙන් සමුගත්තේ යැයි කියැවෙන විශ්වවිද්‍යාල සිසුවා පිළිබඳ ප්‍රවෘත්තියයි.

මෙය පැහැදිලිවම මහජන ලැදියාවට අදාළ වන පුවතක් වුවත්, එය පවා උපරිම ප්‍රවේසම් සහගත බවකින් යුතුව, හැකි උපරිමයෙන් මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල වෙමින් පළ කිරීමට නොහැකිද? සැබවින්ම යම් යම් පුවත්පත් මගින් එම ප්‍රවේශම් සහගත ප්‍රවේශය මෙම ප්‍රවෘත්තිය වාර්තා කිරීම සම්බන්ධයෙන්ද ගෙන ඇති බව පහත සටහන ඔස්සේ පෙනී යනු ඇත.